# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2093/38 - 2018 ඔක්තෝබර් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය:* 10/3/1/3/69.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:*4-3/2/2015/ඒ/09.

ව්‍යාප්ති නිළධාරී නිල නිවාසයක් ඉදිකිරීම සඳහා පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, විහාරගම ග්‍රාම නිළධාරී වසමේ, කළුදැවල ගමේ පිහිටි, මාතලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් සහතික කරන ලද මා 1739 හා 2018.09.27 දිනැති මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: සුදුගගවත්ත;ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, තැ.පෙ.1526, අංක සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0682.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 නොවැම්බර් මස 21 වැනි දින පෙ.ව. 10.00 ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 නොවැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එම්. එන්. දිනිප්‍රිය,
ප්‍රාදේශීය ලේකම්,
රත්තොට.

2018 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 137

1A - G 28765 - 72 (2018/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**
7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකයː* - BER/4/5/5/09.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය ː* 4-3/6/2016/HW/179.

මා විසින් 2018/09/10 දින අංක 2088/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් රජයට අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ මූලික පිඹුරු අංකය හා පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක ක. 4707 යන්න වෙනුවට සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක ක. 4703 ලෙස සංශෝධනය විය යුතුය.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 නොවැම්බර් මස 07 වැනි දින පෙ.ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 නොවැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. ජී. ඩී. චතුර මල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

11 - 138

---

සංශෝධනයයි

*මගේ අංකයː* - KDS/UDP/4/1/LAQ/Mor.Pro/37.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය ː* 4-3 /2014/CEB/422.

අංක 1988/2 2016.10.10 දිනැති ගැසට් නිවේදනයෙහි ප්‍රකාශිත කැබලි අංක 300 (කැඩැස්තර සිතියම් අංක (සී.එම්.)320042 (2) 10 දරන ඉඩම් කැබැල්ලේ විස්තරය පහත පරිදි සංශෝධනය විය යුතුය.

**වන්දි පරීක්ෂණ දිනයන් හා වේලාව:**

| *අනු අංකය* | *කැඩැස්තර සිතියම් අංකය* | *කැබලි අංක* | *කැබලි ගණන* |
|---|---|---|---|
| 01 | සී.එම්.320 042(4) 02 | 348 | 01 |
| 02 | සී.එම්.320 042(4) 02 | 349 | 01 |

| *වන්දි පරීක්ෂණ දිනය* | *වේලාව* | *ස්ථානය* |
|---|---|---|
| 2018.11.14 | පෙ.ව. 9.30 | ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 2018.11.14 | පෙ.ව. 9.30 | ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

ආර්.ඒ.ඩී.ටී.එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත,
ගම්පොල.

2018 ඔක්තෝබර් මස 17 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.